දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXW/04/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 29.11.2024
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 – 170/2024**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ,

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර,

අධ්‍යක්ෂ - ජාතික රෝහල, ගාල්ල,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

රජයේ අමාත්‍යාංශය යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාළ ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT - 6) III වන ශ්‍රේණියේ අංග ආදේශක හා සෘජුකරණඥ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (පළමු වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අංග ආදේශක හා සෘජුකරණඥ III ශ්‍රේණියේ නිලධාරීන් එම ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ගතවීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2025/01/26** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අංග ආදේශක හා සෘජුකරණඥ නිලධාරී (MT- 6) සඳහා වන තනතුරක III ශ්‍රේණියේ පත්වීම් ලද නිලධාරීන්ට හා අංග ආදේශක හා සෘජුකරණඥ තනතුරක III ශ්‍රේණියේ පත්වීම් ලද නිලධාරීන්ට පමණි.

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට **2024/12/23** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර "III වන ශ්‍රේණියේ අංග ආදේශක හා සෘජුකරණඥ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (පළමු වාරය)" ලෙස සඳහන් කල යුතුය. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින්ද, සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.**110.00** ක් වටිනා මුද්දර ඇලවූ 9''X4'' ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. විභාග ගාස්තු

I. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත්කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පටිපාටිය

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසි** ලෙස ද රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා කාලය පැය 03 ක් සහ ලකුණු 100 ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.

07. විෂය නිර්දේශ මාලාව

**07. 1 ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ. රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් සමන්විත වන අතර එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. කාලය පැය තුනකි. මුළු ලකුණු 100කි.

❖ **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේදය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මත සැකසේ.**

IV වන පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම

❖ **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද**

XII වන පරිච්ඡේදය - නිවාඩු

XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර

XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුළත රාජකාරි ගමන්

XIX වන පරිච්ඡේදය - රජයේ නිවාස

XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය

XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති

* **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති**

**07.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. කාලය පැය තුනකි. මුළු ලකුණු 100කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

| | | |
|---|---|---|
| I | වන පරිච්ඡේදය - | වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මු. රෙ 1 සිට මු. රෙ 68 දක්වා) |
| III | වන පරිච්ඡේදය - | මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරි, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම. ( මු. රෙ 124 සිට මු. රෙ 147 දක්වා) |

08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.

**ස.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

**EXW**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT - 6) III වන ශ්‍රේණියේ අංග ආදේශක හා සෑපුකරණ (?) නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 (පළමු වාරය)**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................................................................

..............................................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

III. මුලකුරු සමග නම (සිංහලෙන්..............................................................................................

..............................................................................................

IV. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) I. මුල් පත්වීමේ දිනය..............................................................................................

II. මුල් පත්වීමේ ලිපි අංකය..............................................................................................

III. දැනට ලබන වාර්ෂික වැටුප..............................................................................................

IV. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

V. ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

VI. විද්‍යුත් ලිපිනය: ..............................................................................................

02. ඔබ මෙවර පෙනීසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ☐

මුදල් රෙගුලාසි ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය :- සිංහලෙන්..............................................................................................

ඉංග්‍රීසියෙන් ..............................................................................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය - ..............................................................................................

(ඇ) මෙම ආයතනය අයත් වන්නේ :- ජේඛීය අමාත්‍යාංශයට ☐ පළාත් සභාවට ☐

(ඈ) පළාත් සභාවට නම් අදාල පළාත :- ..............................................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ..............................................................................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) - ..............................................................................................

..............................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..............................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය -(සිංහල/දෙමළ/ඉංග්‍රීසි)..............................................................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..............................................................................................

(ආ) මෙම විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේද?

| |
|---|
| මුද්දර කොටුව |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

..........................................

දිනය .......................................... අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ /නිලධාරිණියගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සියලූ සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

..................................................

දිනය :-..................................... නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

...............................................................මහතා/මිය/මෙනවිය*.....................................................................නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/නොවන* බවද, රු ............. ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය ........................ ..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

....................................................මහතා/මහත්මිය/මෙනවිය*..................................... නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ......................... ..................................................

විමධ්‍යගත කොට්ඨාශ

විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ

අත්සන [රබර් මුද්‍රාව තැබිය යුතුය]

(*අනවශ්‍ය කොටස් කපා හරින්න. )